සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்ந்நி அபிவிருந்நி நிணைக்களம்
**Department of Samurdhi Development**

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி,வதிவிடப் பொருளாதார,நுண்நிதிய,சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


මගේ අංකය **DSD/HO/06/EP/10/200,000 - 2021**
My No

ඔබේ අංකය
உமது இல ..............................................
Your No

දිනය
திகதி 2021.08.03
Date

සියළුම දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂවරුන්,

සියළුම සමෘද්ධි කලමණාකරුවන්/ සියළුම සංවර්ධන නිලධාරීන් වෙත.

**දීප ව්‍යාප්ත සමෘද්ධි අලෙවිසැල් ජාලයක් විවෘත කිරීම.**

මේ යටතේ DSD/HO/04/LH/Circular/2021 හා 2021.02.20 දිනැති සමෘද්ධි චක්‍රලේඛ අංක 2021/05 මගින් ඔබ ඇමතූ සමෘද්ධි පවුල් ලක්ෂ දෙකක් (2000,000) කේන්ද්‍ර කරගත් අංග සම්පූර්ණ ගෘහ නේවාසික ආර්ථිකයක් සංවර්ධනය කිරීමේ වැඩසටහන හා එහි "ව්‍යාපෘති හඳුනා ගැනීම"හි අංක vi හි සඳහන් කාරණා සහ මේ පිළිබඳව නිකුත් කරන ලද අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ අංක DSD/HO/04/ER/9/ ගෙවතු 2021 හා 2021.07.20 දිනැති ලිපියට වැඩිමනත් වශයෙනි.

02. ඒ අනුව පවුල් ලක්ෂ දෙකක් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ අලෙවිසැල් තෝරා ගැනීම සිදු සිදු කල නොහැකි අවස්ථාවන්හිදී වෙනත් සිල්ලර වෙළඳසැලක් තෝරාගත හැකිය. ගෝලීය මට්ටමින් මෙන්ම ජාතික මට්ටමින් ඇති වන ව්‍යසනකාරී තත්ත්වයන් වලදී හා ආපදා අවස්ථාවන් වලදී සහන සේවා පදනමින් පාරිභෝගිකයින් සඳහා භිභයකින් තොරව භාණ්ඩ හා සේවා පහසුකම් සපයා ඔවුන් අපහසුතාවයට පත්වීම අවම කිරීම මෙම වෙළඳ සැල් මගින් ඉටු කර ගැනීම අපේක්ෂාව වේ.

03. දැනටමත් පවත්වා ගෙන යනු ලබන සමෘද්ධිලාභී / අඩුආදායම්ලාභී අලෙවිසැලක් මේ සඳහා තෝරා ගැනීම වඩාත් ප්‍රතිඵලදායක වනු ඇත. මෙම වෙළඳසැල තුළ කෘෂි, ධීවර, සත්වපාලන, ගෘහස්ථ කර්මාන්ත වලට අයත් නිෂ්පාදන හා සේවාවන් සහ වෙනත් පහසුකම් අලෙවි කිරීමේ පහසුව පැවතීමද අමතර සුදුසුකමක් සේ සැලකිය හැකිය. මෙහිදී අලෙවිසැලෙහි සුපුරුදු ලෙස අලෙවි කෙරෙන භාණ්ඩ වලට අමතරව ප්‍රදේශයේ වෙනත් නිෂ්පාදකයින්ගේ සුදුසු නිෂ්පාදනද අලෙවියට පහසුකම් සැලසීම වඩාත් වාසිදායක වනු ඇත. එමගින් ප්‍රදේශයේ අනෙකුත් නිෂ්පාදකයින්ගේ නිෂ්පාදන අලෙවි කර ගැනීමෙන් ඔවුන්ගේ ආර්ථිකය වර්ධනය කිරීමට හා එම නිෂ්පාදන පිළිබඳ ප්‍රචාරයක් ලබා දීමටද හැකියාව ලැබෙනු ඇත.


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887** |

03. මේ සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම සමෘද්ධි පවුල් ලක්ෂ දෙකක් (2000,000) කේන්ද්‍ර කරගත් අංග සම්පූර්ණ ගෘහ නේවාසික ආර්ථිකයක් සංවර්ධනය කිරීමේ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ සළසා ගත හැකි බව දන්වන අතර ඔබ විසින් තෝරා ගන්නා අලෙවි සැල් පිළිබඳ තොරතුරු CRM පද්ධතියට පහත අයුරින් ඇතුළත් කළ හැකිය. එහිදී මෙම කාර්ය සඳහා තෝරා ගත් ව්‍යවසායකයෙකු දනටමත් CRM මොඩියුලයේ Marketing යටතේ ඇති සිල්ලර වෙළඳාම කාණ්ඩය යටතේ ඇතුළත් කර ඇත්නම් එය වෙනස් කර කොට පහත සඳහන් කාණ්ඩ තුනෙන් අදාළ කාණ්ඩයට ඇතුළත් කළ යුතුය.

(1) වසම් මට්ටමින් තෝරා ගන්නා සිල්ලර වෙළඳ සැල - "වසමට එකක් සිල්ලර වෙළඳ සැල"

(11) සමෘද්ධි ප්‍රජා මූල බැංකු මට්ටමින් තෝරා ගන්නා සිල්ලර වෙළඳ සැල - " බැංකුවට එකක් සිල්ලර වෙළඳ සැල"

(111) සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිති මට්ටමින් තෝරා ගන්නා සිල්ලර වෙළඳ සැල - ප්‍රජාමූල බැංකු සමිතියට එකක් සිල්ලර වෙළඳ සැල"

ප්‍රතිලාභීන්ගේ ආර්ථික මට්ටම වර්ධනය කෙරෙන හා ප්‍රදේශයේ ජනතාවට වඩාත් ක්‍රමවත් හා ගුණාත්මක සේවාවක් සැපයීමට හැකිවන පරිදි දීප ව්‍යාප්ත සමෘද්ධි අලෙවිසැල් ජාලය ස්ථාපිත කිරීමේ වැඩසටහන කෙරෙහි ඔබගේ පුද්ගලික අවධානය යොමු කොට කටයුතු කරනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම දීපව්‍යාප්ත සමෘද්ධි අලෙවිසැල් ජාලය සාර්ථක නර ගැනිම සඳහා ඔබගෙන් ලැබෙන සහය ඉතා අගය කොට සලකමි.

එම්. ජී. එස්. එස්. කිත්සිරි
අධ්‍යක්ෂ (ව්‍යවසාය සංවර්ධන) වැ. ආ.
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.